දොස්තරගේ අල්ලපු වැටේ ඉන්නේ, සපත්තු මහන්නෙක්. පවුල් දෙක අතර මායිම් ප්‍රශ්න කලක ඉඳලා තියෙනවාලු! පොඩ්ඩ එහා මෙහා වෙන්න බැරිලු, දොස්තර යනවාලු පොලීසි !!

පානදුර දකුණ පොලීසිය අපරාධ නඩු විධි විධාන සංග්‍රහයේ 81 වගන්තිය යටතේ සපත්තු මහන්නාට විරුද්ධව නඩුවක් දැම්මා. දොස්තරගේ බලපෑමට.

දොස්තර දාපු බව කියන පැමිණිලි 05 ක් නම් කරලා. දාපු නඩු වලින් කියන්නේ, සපත්තු මහන්නා හා බිරිඳ බැන තර්ජනය කරන බව. නින්දා අපහාස කරන බව.


...ංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රාහා පනතේ 81 වන වගන්තිය ප්‍රකාරව සාමය
... කිරිම සඳහා ඇප බැඳුම්කරයකට යටත් කිරිම සම්බන්ධයෙන් අධිකරනය වෙත කරුණු
...කරමින් වග උත්තර පාර්ශවය අධිකරනය වෙත ඉදිරිපත් කරමින් ඇප බැඳුම්කරයකට
...කිරිම සඳහා කරනු ලබන ඉල්ලිම.

නඩු අංකය - 85223/2021

...ලිකරු -
...ධිපති,
...පැමිනිලි අංශය
...ස්ථානය
...ර දකුන.

සි අයි බි (03) 380 / 122 (2016.02.11);
ඊ පි අයි බි 216 / 110 (2016 .02.27 );
සි අයි බි (3) 191 / 228 (2019.01.17 );
සි අයි බි (01) 217 / 472 (2016.07.31);
සි අයි බි (03) 81 / 145 (2021/03/17).

පොලීසය තව දුරටත් උසාවියට කියනවා;

- සපත්තු මහන්නා, අහල පහල නාන ගෑණු දිහා බලන් ඉන්නවාලු!
- නිවස ඉදිරිපිට ත්‍රීරෝද රථය නවත්වා මාර්ගය අවහිර කරනවාලු!
- පාසල් සිසු දරු දැරියන්ට අසභ්‍ය උසුලු කරනවාලු!

මේවා කියල පොලීසිය උසාවියේ ඉල්ලන්නේ සපත්තු මහන්නාගේ ඇඟ බඳින්න කියලා.

නඩුව දාලා, වාර 05 ක් ගිය තැන තමයි හිරණ පොලීසිය ඇවිත් සපත්තු මහන්නාට, උසාවියට ඉදිරිපත් වෙන්න කියලා චිට් එකක් දෙන්නේ.

චිට් එක අනුව, සපත්තු මහන්නා, නීතිඥ මහතෙකු මගින් උසාවියට ඉදිරිපත් වෙනවා.

පොලීසිය නඩුවේ සාක්ෂිකරු වශයෙන් නම් කරපු මුතු හේවාගේ චන්දන තුෂාර සිරිල් (දොස්තර) ද, නීතිඥවරයෙකු ඉදිරිපත් කරනවා.

වාර කිහිපයකට පස්සේ, පානදුර ''බාර්'' එකේ නීතිඥවරු හලලා, මාතරින් කියා නීතිඥයකු ගේනවා. නම නීතිඥ සාරංග වාදසිංහ.

කරුණු දක්වන්න කියලා, උසාවිය අවසාන දිනය ලෙස, 2023.11.29 දිනය නියම කරනවා.

එදා නීතිඥ සාරංග වාදසිංහ ''දොස්තර'' වෙනුවෙන් ඉදිරිපත් වෙනවා. සපත්තු මහන්නා ගේ නීතිඥවරයා, පොලීසියෙන් ඉල්ලා සිටිනවා, අඩුම වශයෙන් ''දෙස්තර'' වෙනුවෙන් පොලීසිය කියන 22ක් ගම්මු අත්සන් කරපු පෙත්සම ඉදිරිපත් කරන්න කියා. ඒ ඉල්ලා සිටිනවාත් සමගම, ''දොස්තර'' ගේ නීතිඥ සාරංග වාදසිංහ පපුව අල්ලාගෙන ඇද වැටෙනවා. උසාවියේ සියලෝම කලබලයට පත්වෙනවා. ''දොස්තර'' ද එක්ව නීතිඥ සාරංග නදසිංහ ව ඉස්පිරිතාලෙට ගෙනියනවා.

නඩුව කල් දානවා. 2024.07.07ට.


**2024.02.07**

වග/උ :- මහේන්ද්‍ර ප්‍රේමලාල් ද සොයිසා. (සිටී)

-බැඳුම්කරයකට ඇතුලත් නොකිරීමට හේතු දැක්වීම.-

20 FEB 2024
පානදුර

වගඋත්තරකරු වෙනුවෙන් නි/ දිලූක එන් සිල්වා මයා පෙනී සිටී.

පැමි/- වෙනුවෙන් නීතිඥ සාරංග වාදසිංහ මයා පෙනී සිටී.

පැමි. වෙනුවෙන් ප්‍ර.පො.ප විජේතුංග නිලධාරී පෙනී සිටී.

දැනට සාමය කඩවීමට හේතු ඉදිරිපත් වී නොමැති බවට පාර්ශවයන් අතර සාමය ඇති බව පාර්ශවයන් විසින් කරුණු ඉ/කරයි.

දෙපාර්ශවය අවවාද කර මුදා හරිමි.

අ/කලේ:-....... (මහේ.... පානදුර)

එදින දෙපාර්ශවයටම අවවාද කරන උසාවිය නඩුව ඉවර කරනවා.

සපත්තු මහන්නාට, වසර 3 ක් උසාවි යන්න වෙනවා.

සපත්තු මහන්නා, පානදුර දකුණ පොලීසිය, දොස්තරගේ, අයුතු බලපෑම්වලට යටත්ව නඩු පවරා කරන ලද හිරිහැරය පාඩුව මෙන්ම, ජනතාවගේ බදු මුදල් හා අධිකරණයේ කාලය විනාශ කිරීම ගැන,

පොලිස්පතිට හා බොරු නඩු දමා මූලික අයිතීන් කඩ කිරීම ගැන මානව හිමිකම් කොමිෂමට පැමිණිලි කරනවා.

නීති පොතට අනුව, සපත්තු මහන්නාගේ නීතිඥවරයා, තම සේවාදායකට විරුද්ධව දපු බව පොලීසි නම් කරපු පැමිණිළි 05 සහතික පිටපත් ඉල්ලනවා. පොලීසිය දෙන්නේ නෑ.

ඊට පස්සේ සපත්තු මහන්නා, පොලීසි නම් කරපු පැමිණිළි 05 සහතික පිටපත් ඉල්ලනවා.

එහෙම පැමිණිලි නැහැ කියා දෙන්නේ නෑ.

එම කාරණය ද ඇතුලත් කර, නැවත සපත්තු මහන්නා, පොලීසි නම් කරපු පැමිණිළි 05 සහතික පිටපත් ඉල්ලනවා.

එවරද නැහැ කියනවා. හැබැයි වාචිකව, ලිඛිතව දෙන්නේ නෑ.

පවතින වාතාවරණය යටතේ ''යුක්තිය''ඉටු වෙන්නේ '' කණ කොකා ඉඳි කටු හිලෙන් අහස බලන දට විය හැකි බව වන මතය කුමක් වුවත් ඉදිරි පියවර ගන්න සුදානම්....